පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION - NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 09 |

# අවසාන වාර පරීක්ෂණය - 2023

විෂයය :- පුරවැසි අධ්‍යාපනය I, II

පාසලේ නම : ........................................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය පැය 02 යි.

## පුරවැසි අධ්‍යාපනය I

**සැලකිය යුතුයි :**

❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියා දක්වන්න.**

01. යහපත් ලෙස කටයුතු කරන විනයගරුක පුද්ගලයෙකු සමාජයට දායක කිරීමේ ප්‍රමුඛ වගකීම ....................................... ( පාසල / පවුල / සමාජය )

02. මහජනතාවගේ බහුතර කැමැත්ත මත ඔවුන් විසින් ගොඩනගා ගනු ලබන පාලන ක්‍රමය ........................................... පාලනය ලෙස සරල ව හැඳින්විය හැකිය. ( පළාත් සභා / යහ / ප්‍රජාතන්ත්‍රවාදී )

03. රාජ්‍යයක හෝ සමාජයක සියලු දෙනාට අවනත විය යුතු රාජ්‍ය විසින් පනවනු ලබන සමස්ත රෙගුලාසි පද්ධතිය ............................................................. ( රීති/ නීති/ සිරිත් විරිත්)

04. ගැටුම් අවස්ථාවක දී භෞතික සම්පත්, මානව සම්පත් හා ......................................................... ද විශාල වශයෙන් නාස්ති වේ. ( කාලය / මුදල් / ශක්තිය )

05. රැකියාවට අයදුම් කිරීමේ දී නම, ගම, වයස සඳහන් කිරීම ........................................................................................ වලට අයත් වේ. ( පෞද්ගලික තොරතුරු / පෞද්ගලික ගුණාංග / පෞද්ගලික කුසලතා )

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (√) ලකුණ ද වැරදි නම් ( X) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06. ජනතාව අතර ඇති වන සුළු ආරවුල් අධිකරණ වෙත නොගොස් නිරාකරණය කරනුයේ ග්‍රාමෝදය මණ්ඩලය මගිනි. (.............)

07. ශ්‍රී ලංකා අතීතයේ සිට ම කෘෂිකර්මය තම ජීවනෝපාය බවට පත් කර ගත් රටකි. (.............)

08. 1978 අංක 15 දරණ පනත මගින් ප්‍රාදේශීය සභා පිහිටුවා ඇත. (.............)

09. " රට වට බැඳි රන් වැට " යන පාඨය නාවික හමුදාවේ ආදර්ශ පාඨය වේ. (..............)

10. ජීව දත්ත පත්‍රිකාවක් සකස් කිරීමේ දී අවශ්‍ය කරුණු නිවැරදි ව හා පැහැදිලි ව ඉදිරිපත් කළ යුතුය. (.............)

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.**

11. 1863 දී වහලුන් ලෙස දුක් විඳි ජනතාවගේ සමාජ සුරක්ෂිතතාව ඇති කළ ඇමෙරිකානු නායකයෙකි.

(1) ජෝන් කෙනෙඩි (2) ඒබ්‍රහම් ලින්කන්

(3) ඩොනල්ඩ් ට්‍රම්ප් (4) ජෝර්ජ් වොෂින්ටන්

12. ආර්ථිකයක සිදු වන වෙනස්වීම් පිළිබඳ සලකා බැලිය හැකි ප්‍රධාන අංශ කිහිපයක් වේ. ඒවා නම්,

(1) කාර්මික , සේවා (2) සේවා , කෘෂිකාර්මික

(3) කෘෂිකාර්මික , කාර්මික (4) කෘෂිකාර්මික , කාර්මික සහ සේවා

13. පුරවැසියෙකු සතු වූ මූලික අයිතිවාසිකමක් වනුයේ ,

(1) නිදහසේ ජීවත් වීම. (2) වැඩිහිටියන්ට සැලකීම.

(3) පොදු දේපල සුරැකීම. (4) සෙසු අයගේ නිදහසට අයිතිවාසිකම්වලට ගරු කිරීම.

14. ගැටුම් ඇති වීමට බලපාන හේතුවක් නොවන්නේ,

(1) නූගත්කම (2) සමාජානුයෝජනය නොවීම.

(3) සමාජ විෂමතා (4) පරාර්ථකාමී වීම.

15. සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන පුද්ගලයෙකුගේ පෞද්ගලික පෙනුම මැන බැලන අංගයක් වන්නේ මින් කුමක්ද?

(1) ඉඳ ගැනීම. (2) ඇඳුම් පැළඳුම්

(3) අත් චලන (4) මුහුණෙන් පෙන්වන හැඟීම්

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ඇති (අ) කොටසේ ප්‍රශ්නවලට අදාළ පිළිතුර (ආ) කොටසින් තෝරා ඉදිරියේ ඇති වරහන තුළ අක්ෂරය යොදන්න.**

(16) එකිනෙකාට උදවු කරගනිමින් සහයෝගයෙන් කටයුතු කිරීම (.................) (A) 1958

(17) සර්ව ජන ඡන්ද බලය හිමි වන වයස් සීමාව අවුරුදු 21 සිට 18 දක්වා අඩු කිරීම . (................) (B) උපදේශනය යි.

(18) මහනගර සභාවේ ප්‍රධානියා වේ. (..................) (C) 119

(19) විවිධාකාරයෙන් පහසුකම් සපයා උපදෙස් හා මඟ පෙන්වීම ලබා දෙමින් ගැටුම් නිරාකරණයට යොමු වීම. (................) (D) අන්‍යෝන්‍ය රැඳියාව

(20) පොලිසිය මගින් හදිසි කරදර, හදිසි අනතුරු සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ක්ෂණික දුරකථන අංකයකි. (...................) (E) නගරාධිපති

( ලකුණු 20 × 2 = 40 )

# පුරවැසි අධ්‍යාපනය II

**වැදගත්**

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුලු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. (i) නීතියේ මූලාශ්‍ර 02ක් නම් කරන්න.

(ii) තාක්ෂණය වෙනස්වීම නිසා ඇති වන හිතකර බලපෑම් 02ක් ලියන්න.

(iii) සමාජ විරෝධී ක්‍රියා මැඩපැවැත්වීමට හා සමාජ සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා ක්‍රියාත්මක වන ආයතන 02ක් ලියා දක්වන්න.

(iv) සමූපාකාර සේවාවෙන් ඉටු වන කාර්යයන් 02ක් ලියන්න.

(v) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ මූලික ස්වරූප 02ක් නම් කරන්න.

(vi) පළාත් පාලන ආයතන අවශ්‍ය වීමට හේතු 02ක් සඳහන් කරන්න.

(vii) නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ පළාත් පාලන ආයතන 02ක් නම් කරන්න.

(viii) ගැටුම් නිරාකරණය සඳහා අවශ්‍ය ගුණාංග 02ක් ලියන්න.

(ix) වෘත්තීය පුහුණුව ලබා ගත හැකි පාඨමාලා 02ක් සඳහන් කරන්න.

(x) රැකියා දැන්වීමක් සඳහා ප්‍රතිචාර දැක්විය හැකි ප්‍රධාන ක්‍රම 02ක් ලියන්න.

(ලකුණු 2 × 10 = 20 )

02. (i) සමාජ සුරක්ෂිතතාව කෙරෙහි බලපාන ආයතන 02ක් ලියන්න. ( ලකුණු 02 )

(ii) ආරවුලක් සමථ මණ්ඩලය වෙත යොමු කළ හැකි ක්‍රම 03ක් ලියා දක්වන්න. ( ලකුණු 03 )

(iii) ආගමික ආයතන සමාජ සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහා සිදු කරනු ලබන කාර්යයන් 05ක් ලියන්න. ( ලකුණු 05 )

03. (i) යහජීවනය යනු කුමක්ද? ( ලකුණු 02 )

(ii) මානව සමාජය යහපත් ව පවත්වා ගෙන යාම සඳහා ප්‍රගුණ කළ යුතු යහජීවන ගුණාංග 03ක් නම් කරන්න. ( ලකුණු 03 )

(iii) යහජීවනයෙන් යුතුව කටයුතු නොකිරීම නිසා පුද්ගලයාට මුහුණ දීමට සිදු වන ප්‍රතිවිපාක 05ක් ලියා දක්වන්න. ( ලකුණු 05 )

04. (i) ගැටුම් ඇති වන පාර්ශවයන් 02ක් නම් කරන්න. ( ලකුණු 02 )

(ii) ගැටුම් නිරාකරණය සඳහා යෝග්‍ය ක්‍රමවේද 03ක් ලියන්න. ( ලකුණු 03 )

(iii) ගැටුම් නිරාකරණය කර ගැනීම නිසා අත්වන වාසි 05ක් ලියා දක්වන්න. ( ලකුණු 05 )

05. (i) වෘත්තීය පුහුණු ලබා ගත හැකි ආයතන 02ක් නම් කරන්න. ( ලකුණු 02 )

(ii) ඔබගේ පෞද්ගලික ගොනුවක ඇතුළත් විය යුතු වැදගත් තොරතුරු 03ක් ලියන්න. ( ලකුණු 03 )

(iii) කාලය කළමනාකරණය කිරීමෙන් අත්වන වාසි 05ක් ලියා දක්වන්න. ( ලකුණු 05 )

06. (i) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක මූලික ලක්ෂණ 02ක් ලියන්න. ( ලකුණු 02 )

(ii) 1928 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ඡන්ද බලය අහිමි වීමට බලපාන හේතු 03ක් ලියා දක්වන්න. ( ලකුණු 03 )

(iii) සමුපකාර සේවාවෙන් ඉටු වෙන කාර්යයන් 05ක් ලියා දක්වන්න. ( ලකුණු 05 )

07. (i) ප්‍රාදේශීය සංවර්ධනය තුළින් ජාතික සංවර්ධනය සඳහා ක්‍රියාත්මක වීමේ දී පළාත් පාලන ආයතන විසින් අවධානය යොමු කළ යුතු කරුණු 02ක් ලියන්න. ( ලකුණු 02 )

(ii) පළාත් පාලන ආයතනය සතු බලතල 03ක් ලියා දක්වන්න. ( ලකුණු 03 )

(iii) පළාත් පාලන ආයතනවලින් ඉටු කරනු ලබන සේවාවන් 05ක් ලියා දක්වන්න. ( ලකුණු 05 )

# පුරවැසි අධ්‍යාපනය I, II

**9 ශ්‍රේණිය** **තෙවන වාර පරීක්ෂණය - 2023**

## පුරවැසි අධ්‍යාපනය I

### ලකුණු දීමේ පටිපාටිය

| | | | | |
|---|---|---|---|---|
| 01.පවුල | 02. ප්‍රජාතන්ත්‍රවාදී | 03. නීති | 04. කාලය | 05. පෞද්ගලික තොරතුරු |
| 06. X | 07. √ | 08. X | 09. √ | 10. √ |
| 11. (2) | 12. (4) | 13. (1) | 14. (4) | 15. (2) |
| 16. D | 17. A | 18. E | 19. B | 20. C |

## පුරවැසි අධ්‍යාපනය II

### ලකුණු දීමේ පටිපාටිය

01. (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව / අධිකරණ තීරණ / ව්‍යවස්ථා (අණපනත්) / නීති විශාරදයන්ගේ මත / සිරිත්විරිත් / ආගම

(ii) වැඩ පහසුවීම / ඵලදායීතාවය වැඩි වීම / කාලය ඉතිරි වීම / කාර්යක්ෂමතාව වැඩි වීම / සම්පත් නාස්තිය අවම වීම / මානව හා සමාජ සම්බන්ධතා පුළුල් වීම

(iii) අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය / ශ්‍රී ලංකා පොලිසිය / ජාතික ළමා ආරක්ෂක අධිකාරිය / පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව / මත්පැන් හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය / 'හෙල්දි ලංකා' සුමිත්‍රයෝ, මිතුරුමිතුරෝ වැනි රාජ්‍ය නොවන ආයතන

(iv) පහසු මිලට පාරිභෝගික ද්‍රව්‍ය අලෙවි කිරීම / ණය පහසුකම් සැපයීම / විවිධ සුභසාධන සේවා පවත්වාගෙන යාම / සාමාජිකක ඉතුරුම් පවත්වාගෙන යාම / දැනුම්වත් කිරීමේ විවිධ වැඩසටහන් කිරීම / බැංකු සේවා සැපයීම / ප්‍රවාහන සේවා සැපයීම / කෘෂි නිෂ්පාදන මිල දී ගැනීම / රක්ෂණ සේවා සැපයීම / රෝහල් පවත්වාගෙන යාම / අවමංගල්‍ය සේවා සැපයීම / ඉන්ධන පිරවුම්හල් පවත්වාගෙන යාම

(v) ඍජු ප්‍රජාතන්ත්‍රවාදය / වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය

(vi) ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ප්‍රාදේශීය මට්ටම දක්වා පුළුල් කිරීම / ප්‍රාදේශීය අවශ්‍යතාවලට ගැළපෙන පරිදි කටයුතු කිරීම / ප්‍රජා සේවා විධිමත් ව පවත්වාගෙන යාමට පහසු වීම / ප්‍රාදේශීය සංවර්ධනය තුළින් ජාතික සංවර්ධනය වේගවත් කිරීම / ප්‍රාදේශීය ප්‍රතිපත්ති පදනම් කරගෙන ප්‍රතිපත්ති සකස් කර ගැනීමට පහසු වීම / මධ්‍යම ආණ්ඩුවේ කටයුතු විමධ්‍යගත කිරීම මගින් ප්‍රාදේශීය පාලන කටයුතු පහසු කර ගැනීම / දේශපාලන නායකත්වය සඳහා තරුණ සහභාගීත්වය පුළුල් කිරීම / අනාගත දේශපාලන නායකයන් ප්‍රාදේශීය මට්ටමින් බිහි කර ගත හැකි වීම / හදිසි අවස්ථාවල දී ක්ෂණික ව ක්‍රියාත්මක වීම පහසු වීම

(vii) ගම් සභා / සුළු නගර සභා / නගර සභා / මහනගර සභා

(viii) ඉවසීම / සක්‍රීය සවන් දීම / කාරුණික බව / සුහදශීලී බව / තීරණ ගැනීමේ හැකියාව / අදහස් පැහැදිලි ව ප්‍රකාශ කිරීම / චිත්තවේග සමනය / අන්‍ය අදහස්වලට ගරු කිරීම / පරිත්‍යාගශීලී බව / මධ්‍යස්ථ බව / සෑම පුද්ගලයෙකුට ම ගරු කිරීම / සාධාරණ විනිශ්චය / අයිතිවාසිකම්වලට ගරු කිරීම / තම යුතුකම් ඉටු කිරීම

(ix) මෝටර් රථ අලුත්වැඩියාව / පරිගණක පුහුණුව / රූපලාවන්‍ය / ආහාර සැකසීම / විදුලි කාර්මික / සැලසුම් ශිල්පී / හෙද පුහුණුව

(x) ජීව දත්ත පත්‍රිකාවක් මගින් / රැකියා ඉල්ලුම් පත්‍රයක් මගින් / ලිපියක් මගින්

02. (i) පවුල / පාසල / ආගමික ආයතන / සමාජ ආයතන

(ii) පොලිසිය මගින් / අධිකරණය මගින් / පෞද්ගලික යොමු කිරීමක් මගින්

(iii) යහපත් ආකල්ප ඇති කිරීම / විනය හා ශික්ෂණය ඇති කිරීම / ආධ්‍යාත්මික සංවර්ධනයට මඟ කියා දීම / ගුණගරුක පුරවැසියන් බිහි කිරීම / මද්‍යසාර, මත්ද්‍රව්‍ය භාවියේ ආදීනව පහදා දී ඉන් මුදවා ගැනීම / සමාජ විරෝධී හා විෂමචාර ක්‍රියාවල අහිතකර බලපෑම් අවබෝධ කර දීම හා ඉන් මුදවා ගැනීම / සහයෝගීතාව හා උපකාරය හුරු කිරීම / සිරිත්විරිත්, සම්ප්‍රදාය හුරු කිරීමට හා ආරක්ෂා කිරීමට ඉගැන්වීම / ජීවිතය පිළිබඳ ව සුබවාදී නිවැරදි දැක්මක් ඇති කිරීම / ජාතික සමගිය, ජාතික ඒකග්‍රතාව ඇති කිරීම සඳහා සහාය වීම / තිරසර සාමය සඳහා කටයුතු කිරීම

03. (i) යහපත් ව ජීවත් වීම / අන් අයට කරදරයක් නොවන අයුරින් නීත්‍යානුකූල මාර්ගවලින් ධනය උපයාගෙන ධාර්මික ව ජීවත් වීම

(ii) නීතිගරුක වීම / හොඳින් සවන්දීම / පරිත්‍යාගශීලී බව / කළගුණ සැලකීම / ලද දෙයින් සතුටු වීම / සුහදශීලී බව / ධාර්මික බව / සැහැල්ලු දිවි පැවැත්ම / ධෛර්යවන්ත බව / සමාජ විරෝධී ක්‍රියාවලින් ඈත් වීම / උත්සාහවන්ත බව / සතුටින් සිටීම / කඩිසර බව / අවංක බව / ස්තුති කිරීම / කරුණාව / ඉවසීම / පරිසරයට ආදරය කිරීම / හෘදය සාක්ෂියට අනුව කටයුතු කිරීම / මද්‍යසාර, මත්ද්‍රව්‍ය භාවියෙන් හා විවිධ විෂමචාර ක්‍රියාවලින් වැළකීම

(iii) මිනිසාගේ ජීවිත කාලය අවාසනාවන්ත ලෙස ගෙවී යාම / අන්තර් පුද්ගල සම්බන්ධතා බිඳ වැටීමෙන් පුද්ගලයා හුදකලා වීම / ස්වාභාවික සම්පත් විනාශ වීම / වියදම අධික වීම, ඉතිරි කිරීම් අඩු වීම / නාස්තිය වැඩි වීම / යහ පැවැත්ම බිඳ වැටීම / සමාජ සුරක්ෂිත බව බිඳ වැටීම / සමාජ සාමය බිඳ වැටී / සමාජ විරෝධී ක්‍රියා වැඩි වීම / ආතතිය වැඩි වීම / අපචාර වැඩි වීම / අල්ලසට හා දූෂණයට යොමු වීම / බිය සැක සහිත ව ජීවත් වීමට සිදු වීම

04. (i) තමා තුළ (පුද්ගලයා තුළ) / තමන් හා මිතුරන් අතර (පුද්ගලයන් දෙදෙනකු අතර) / පවුලක් තුළ / අසල්වැසියන් අතර (පුද්ගලයන් අතර/පවුල් අතර/පුද්ගල කණ්ඩායම් අතර) / සංස්කෘති අතර / ස්වකීය රාජ්‍ය තුළ/රාජ්‍ය දෙකක් අතර/ රාජ්‍ය කිහිපයක් අතර

(ii) සාකච්ඡා කිරීම / මැදිහත්කරණය / සමථකරණය / විනිසීම

(iii) සාමය ස්ථාපිත වීම / පුද්ගල හා සමාජ සංවර්ධනයට හේතු වීම / දේශපාලන ස්ථාවර භාවය / සම්පත් නාස්තිය අවම වීම / විශ්වාසය ගොඩ නැගීම / මානසික ආතතිය අවම වීම / පුද්ගල ආත් ගෞරවය සුරක්ෂිත වීම / සුහදතාව ගොඩ නැගීම / සමාජ සම්බන්ධතා වර්ධනය වීම / සංස්කෘතික සහයෝගීතාව වර්ධනය වීම / මූලික අයිතිවාසිකම් ආරක්ෂා වීම / මානව අයිතිවාසිකම් ආරක්ෂා වීම / ජීවිත හා දේපළ හානි වැළකීම / අන්තර්ජාතික සම්බන්ධතා පුළුල් වීම / ආයෝජකයන්ගේ පැමිණීම වර්ධනය වීම

05. (i) කාර්මික විද්‍යාල / වෘත්තීය පුහුණු අධිකාරිය / ජාතික තරුණ සේවා සභාව / ජාතික ආධුනිකත්ව මණ්ඩලය / හෝටල් පාසල / හෙද විදුහල / කෘෂිකාර්මික විද්‍යාල / තාක්ෂණ විශ්වවිද්‍යාල / නීති විද්‍යාල / විද්‍යාතා මධ්‍යස්ථාන

(ii) පෞද්ගලික තොරතුරු / පෞද්ගලික ගුණාංග / පෞද්ගලික කුසලතා / පෞද්ගලික චර්යා / පාසලේ දී ලබා ගත් අත්දැකීම් / පාසලෙන් පිට දී ලබා ගත් අත්දැකීම්

(iii) ආයතනයේ නීතිරීති අනුව කටයුතු කළ හැකි වීම / වැඩ ප්‍රමාදයක් සිදු නොවීම / ආයතනය තුළ හොඳ නමක් දිනාගත හැකි වීම / ආයතනයේ අරමුණු ඉටු කර දිය හැකි වීම / සම්පත් අපතේ යාම වළක්වා ගත හැකි වීම / මානසික පීඩනයෙන් තොරව කටයුතු කළ හැකි වීම / සේවාලභීන් තෘප්තිමත් කළ හැකි වීම / තමන්ට අදාළ රාජකාරිය නියමිත වේලාවට අවසන් කළ හැකි වීම

06. (i) නීතිය උත්තරීතර කොට සැලකීම (නීතියේ ආධිපත්‍යය ක්‍රියාත්මක වීම) / නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමට ඉඩ ප්‍රස්ථා හිමි වීම / නිදහස් ජන මාධ්‍ය පැවතීම / ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල ව පාලන කටයුතු සිදු කිරීම / බහුතර කැමැත්ත මත තීරණ ගැනීම / නිදහස, සමානාත්මතාව හා අයිතිවාසිකම් හිමි වීම / සර්ව ජන ඡන්ද බලය ක්‍රියාත්මක වීම / මහජන ඡන්දයෙන් ආණ්ඩු සහ පාලකයන් පත් කර ගැනීම / රට ඡන්ද කොට්ඨාසවලට බෙදා තිබීම / නීතිය ඉදිරියේ සියලු දෙනා එක හා සමානව සැලකීම / ආණ්ඩු පක්ෂයක් සහ විරුද්ධ පක්ෂයක් පැවතීම / තරඟකාරී පක්ෂ ක්‍රමයක් පැවතීම / ස්වාධීන අධිකරණ පද්ධතියක් රට තුළ ක්‍රියාත්මක වීම / බහුතර නියෝජිතයන් සංඛ්‍යාවකගේ සහය ලැබෙන දේශපාලන පක්ෂය හෝ කණ්ඩායම ආණ්ඩු බලය දැරීම

(ii) සාධාරණත්වය අගය කිරීම / ආදර්ශවත් ගතිපැවතුම් / ආවේගශීලී නොවීම / අවංක බව / පරාර්ථකාමීත්වය /මෘදු බව / තම මතය ඍජුව ප්‍රකාශ කිරීම / පුළුල් අවබෝධයක් සහිතව කටයුතු කිරීම / අන් මත ගරු කිරීම / යුක්තිගරුක බව / නීතිගරුක බව / ඍජු බව

(iii) පහසු මිලට පාරිභෝගික ද්‍රව්‍ය අලෙවි කිරීම / ණය පහසුකම් සැපයීම / විවිධ ශුභසාධන සේවා පවත්වාගෙන යාම / සාමාජික ඉතුරුම් පවත්වාගෙන යාම / දැනුම්වත් කිරීමේ විවිධ වැඩසටහන් කිරීම / බැංකු සේවා සැපයීම /ප්‍රවාහන සේවා සැපයීම / කෘෂි නිෂ්පාදන මිල දී ගැනීම / රක්ෂන සේවා සැපයීම / රෝහල් පවත්වාගෙන යාම / අවමංගල්‍ය සේවා සැපයීම / ඉන්ධන පිරවුම්හල් පවත්වාගෙන යාම

07. (i) ප්‍රාදේශීය අවශ්‍යතා හා සම්පත් හඳුනා ගැනීම / ප්‍රාදේශීය අවශ්‍යතා ඉටු කිරීම සඳහා සම්පත් හඳුනාගෙන ඊට ගැළපෙන ලෙස සැලසුම් සකස් කිරීම / සැලසුම් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම / ප්‍රාදේශීය නායකයන් බිහි කිරීම

(ii) වරිපනම් බදු ඇතුළු අනෙකුත් බදු පැනවීමට / වීථි රේඛා සහතික නිකුත් කිරීමට / නිවාස සැලසුම් අනුමත කිරීම / ස්ථිර ගොඩනැගිලි හා වෙනත් ඉදිකිරීම් සඳහා අවසර දීමට / අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට / පරිසර සංරක්ෂණයට අදාළ කටයුතු ක්‍රියාත්මක කිරීමට / පරිසර සංරක්ෂණයට අදාළ කටයුතු ක්‍රියාත්මක කිරීමට / ප්‍රසිද්ධ මාර්ග, වීථි ඇළ මාර්ග, පාලම්, පොදු වෙළඳපොළ, බෙහෙත් ශාලා, පුස්තකාලය, උද්‍යාන ආදිය ඉදිකිරීමට හා නඩත්තු කිරීමට / බෝවන රෝග වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට / අනවසර මුඩුක්කු, පැල්පත් හා සෞඛ්‍යයට හානි කරන ස්ථාන ඉවත් කිරීමට / ස්වාභාවික ජල උල්පත් හා ජලාශ පිළිබඳ අයිතිය පවත්වා ගැනීමට

(iii) පුස්තකාල, කියවීම් ශාලා , ළමා උද්‍යාන, ක්‍රීඩා පිටි, ව්‍යායාම සඳහා ඇවිදීමේ මංතීරු පවත්වා ගෙන යාම / පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම / පොදු වැදගත්කමකින් යුත් ආගමික හා සංස්කෘතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම / බල ප්‍රදේශයට අයත් මාර්ග අලුත්වැඩියා කිරීම / පාලම්, බෝක්කු ආදිය ඉදිකිරීම / අලුතින් මාර්ග තැනීම / වීථි ආලෝක කිරීම / සෞඛ්‍ය හා සනීපාරක්ෂක සේවා සැපයීම / ජලාපවහන හා මලපවහන පද්ධති නිසි පරිදි පවත්වා ගෙනයාම / කාණු හා ඇළ මාර්ග නඩත්තු කිරීම / පොදු වැසිකිළි පවත්වාගෙන යාම / කසළ නිසි පරිදි කළමනාකරණය කිරීම / කසළ ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම / සෞඛ්‍යයට අහිතකර ද්‍රව්‍ය විකිණීම සහ ප්‍රචාරය වැළැක්වීම / පොදු සුසාන භූමි, ආදාහනාගාර නඩත්තු කිරීම / පොදු නාන ළිං පවත්වාගෙන යාම / ප්‍රාදේශීය අවශ්‍යතා අනුව ජල පහසුකම් සැපයීම /අක්ෂි සායන, ළදරු සායන, මාතෘ සායන, ඩෙංගු වැනි වසංගත රෝග මර්දන වැඩසටහන්, බෝ නොවන රෝග මර්දන වැඩසටහන් පැවැත්වීම (සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න)

# LOL.lk
## BookStore

# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**